---

**හොරොව්පොතාන ප්‍රාදේශීය සභාව**

---

## 1. මූල්‍ය ප්‍රකාශන

---

### 1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම.

---

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2012 මැයි 21 දින ද ඉකුත් වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන 2011 ජුනි 23 දින ද විගණනයට ඉදිරිපත් කර තිබූ අතර සමාලෝචිත වර්ෂයේ විගණකාධිපති වාර්තාව 2012 ඔක්තෝබර් 30 දින සභාවේ සභාපතිවරයාට යවන ලදී.

### 1.2 මතය

---

සභාපතිවරයා වෙත යවන ලද මාගේ වාර්තාවේ දක්වා ඇති අදහස් දැක්වීම් සහ නිරීක්ෂණයන් හේතු කොට ගෙන විගණනය සඳහා ඉදිරිපත් කර ඇති හොරොව්පොතාන ප්‍රාදේශීය සභාවේ 2011 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට මට නොහැකිය.

### 1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම.

---

#### 1.3.1 ගිණුම්කරණ අඩුපාඩු

---

මූල්‍ය ප්‍රකාශනවල පැවති ගිණුම්කරණ අඩුපාඩු හා එමගින් මූල්‍ය ප්‍රකාශනවලට සිදුවී ඇති බලපෑම පිළිබඳ සාරාංශයක් පහත දැක්වේ.

| | අඩුපාඩුවේ ස්වභාවය | විෂයයන් ගණන | වටිනාකම | | |
|---|---|---|---|---|---|
| | | | ආදායම් | වත්කම් | වගකීම් |
| | | | රු.000 | රු.000 | රු.000 |
| (අ) | මූල්‍ය ප්‍රකාශන | | | | |
| | වලින් අත්හැරීම් | 04 | - | 2,804 | - |
| | - එම - | 01 | - | - | 300 |
| (ආ). | මූල්‍ය ප්‍රකාශන | | | | |
| | වල වැඩියෙන් දැක්වීම් | 03 | 611 | - | - |
| (ඇ) | මූල්‍ය ප්‍රකාශන | | | | |
| | වල අඩුවෙන් දැක්වීම් | 01 | 677 | - | - |
| (ඈ) | මූල්‍ය ප්‍රකාශනවල | | | | |
| | අනුචිත හෙළිදරව් කිරීම් | 01 | 34 | - | - |
| | - එම - | 01 | - | - | 217 |

**1.3.2 නොසැසඳූ ගිණුම්**

---------------------

මූල්‍ය ප්‍රකාශන අනුව ගිණුම් විෂයයන් 05 කට අදාල ශේෂයන්ගේ එකතුව රු.79,329,329 ක්වූ අතර උපයෝගී ලේඛන/ වාර්තා අනුව එම ශේෂයන්ගේ එකතුව රු.46,778,327 ක් විය.

### 1.3.3 විගණනය සඳහා සාක්ෂි නොවීම.

-----------------------------------

අවශ්‍ය තොරතුරු විගණනයට ඉදිරිපත් නොකිරීම නිසා එකතුව රු. 10,729,012 ක් වු ගිණුම් විෂයයන් 09 ක් විගණනයේදී සතුටුදායක ලෙස සන්නිරීක්ෂණය කිරීමට නොහැකි විය.

### 1.3.4 ව්‍යාජ වත්කම්

----------------

භෞතිකව ප්‍රාදේශීය සභාව සතුව නොතිබුණු රු.83,385 ක තොග වටිනාකම, මූල්‍ය ප්‍රකාශනවල ඇතුලත්ව තිබුණි.

### 1.3.5 නිරවුල් නොකළ ගිණුම්

-------------------------

මූල්‍ය ප්‍රකාශනවල වසර දෙකකට වැඩි කාලයක් තිස්සේ ඉදිරියට ගෙන එමින් පවතින රු.943,316 ක්වූ ගිණුම් විෂයන් 10 ක් නිරවුල් නොකර ඉදිරියට ගෙන එමින් තිබුණි.

## 2. මූල්‍ය හා මෙහෙයුම් සමාලෝචනය

--------------------------------------

### 2.1 මූල්‍ය ප්‍රතිඵලය

-----------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, 2011 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ ආදායම ඉක්මවු පුනරාවර්තන වියදම රු.80,070 ක්වු අතර ඊට අනුරූපිව ඉකුත් වර්ෂයේ ආදායම ඉක්මවු පුනරාවර්තන වියදම රු.71,186 ක් විය.

## 2.2 ආදායම් පරිපාලනය

### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් හා හිඟ ආදායම්

සභාපතිවරයා විසින් සමාලෝචිත වර්ෂයට අදාලව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම, තථ්‍ය ආදායම සහ හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | ආදායම් විෂයය | ඇස්තමේන්තුගත | තථ්‍ය | දෙසැම්බර් 31 දිනට සමුච්චිත හිඟය |
|---|---|---|---|---|
| | | රු.000' | රු.000' | රු.000' |
| (i). | වරිපනම් හා බදු | 187 | 211 | 209 |
| (ii). | බදු කුලී | 2,373 | 4,014 | 2,418 |
| (iii). | බලපත්‍ර ගාස්තු | 650 | 511 | 1,014 |
| (iv). | වෙනත් ආදායම් | 2,720 | 6,506 | 1,037 |

### 2.2.2 උසාවි දඩ හා මුද්දර ගාස්තු

පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් හා අනෙකුත් බලධාරීන්ගෙන් 2011 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතුව තිබූ මුදල් පහත දැක්වේ.

| | | රු. |
|---|---|---|
| (i). | උසාවි දඩ | 310,167 |
| (ii). | මුද්දර ගාස්තු | 106,210 |

### 2.2.3 කඩකාමර කුලී

----------------

**(අ).** සභාව සතු කඩ කාමර බදු ගත් බදු හිමියන් විසින් කඩ කාමර 11 ක් සඳහා 2007 වර්ෂයේ සිට බදුකුලී ගෙවා නොතිබුණු අතර ගිවිසුම් අසම්පූර්ණ වු බැවින් රු.756,510 ක්වූ එම හිඟ කුලී අය කර ගැනීම සඳහා නීතිමය පියවර ගැනීමටද අපහසුව තිබුණි.

**(ආ).** 1994 අගෝස්තු 04 දිනැති පළාත් පාලන කොමසාරිස්ගේ අංක එන්සීපී/පීඑල්/4/7/19 දරණ චක්‍රලේඛය ප්‍රකාර අවම වශයෙන් වසර 05 කට වරක් වත් තක්සේරු බදු කුලිය සංශෝධනය කල යුතු වුවත්, සභාවට අයත් කඩකාමර කුලී වසර 10 කට පමණ පෙර කර තිබූ තක්සේරුව මත අය කරමින් පැවතුණි.

### 2.3 නිශ්ක්‍රීය හා ඌණ උපයෝජිත භෞතික සම්පත්

---------------------------------------------------

සභාව සතුව පවතින පහත සඳහන් වාහන ප්‍රයෝජනයකට නොගෙන සහා භූමියේ දිරාපත් වෙමින් තිබුණි.

| වාහන අංකය | විස්තරය | නිෂ්ක්‍රියව පැවති කාලය |
|---|---|---|
| 78 - 0159 | අත් ට්‍රැක්ටරය | 2008 පෙර සිට |
| 53 - 5040 | කැබ් රථය | 2008 පෙර සිට |
| 252 - 6536 | කැබ් රථය | 2011 වර්ෂයේ සිට |
| ලියාපදිංචි නොකළ | අත් ට්‍රැක්ටරය | 2008 පෙර සිට |

### 2.4 අවිධිමත් ගනුදෙනු

---------------------

ඉක්ටැඩ් ප්‍රකාශන මාලා අංක එස්සිඒ/1 දරන කොන්ත්‍රාත් වැඩ කොන්දේසි සංග්‍රහයේ 56 ජේදය ප්‍රකාර කළ වැඩ සඳහා මිනුම් ගෙන එම මිනුම් පදනම් කරගෙන පමණක් ගෙවීම් කළයුතු අතර යන්ත්‍ර පැය පදනම් කරගෙන ගෙවීම් නොකළ යුතු වුවද එය නොසලකා යෝජිත බස්නැවතුම්පල හා වෙළඳ සංකීර්ණය ඉදිකිරීමේ කර්මාන්තයේ ඉඩම සැකසීම වෙනුවෙන් මිනුම් නොගෙන යන්ත්‍ර පැය 10 ක් වෙනුවෙන් 2011 නොවැම්බර් 30 දින රු.42,000 ක් ගෙවා තිබුණි.

**2.5 මෙහෙයුම්/කළමනාකණ අකාර්යක්ෂමතා**

ඉදිරි වර්ෂවල ක්‍රියාකාරිත්වයට අදාල සැලසුම් ඇතුළත් සංයුක්ත සැලැස්මක් හා එම සැලැස්මේ සමාලෝචිත වර්ෂය තුළ ක්‍රියාත්මක කිරීමට අපේක්ෂිත කාර්යයන් ඉටුකිරීම සඳහා ක්‍රියාකාරී සැලැස්මක් සකස්කර ක්‍රියාත්මක කර නොතිබුණි.

**3 පද්ධති හා පාලන.**

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි සභාවේ විශේෂ අවධානය යොමු කරනු ලැබේ.

(අ) ගිණුම්කරණය

(ආ). අභ්‍යන්තර පාලනය

(ඇ) ආදායම් පරිපාලනය

(ඈ) වත්කම් කළමනාරණය

(ඉ). කොන්ත්‍රාත් පාලනය